DIBSS

For Long-Life Rice

# කාර්යසාධන වාර්තාව

# 2014

## ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

නො: 330,
යූනියන් පෙදෙස,
කොළඹ 02.

දුරකතන : *011- 2421211*
ෆැක්ස් : *011- 2434291*

## පෙරවදන...................

ශීත සෘතුවෙන් සමුගත් වසන්තයේ දළු කොළ වලින් පිරීගන්නා තුරු ලතා වෙනුවට මැළවී ගත් පරිසරයකින් යුතුව ආරම්භ වූ 2014 වර්ෂයේ පෙර වදන සනිටුහන් කරන්නට මත්තෙන් මා විසින් 2013 වර්ෂයේ පෙරවදනෙහි තබන ලද ආරම්භක සටහන මෙහි ලා සටහන් කිරීම වැදගත් වනු ඇතැයි සිතමි " සොබා දහමේ ආශිර්වාදයෙන් පමණට වැසි පලත්, හිරු එළියත් ලබා කුඹුරුපිටි සරුසාර වනවා සේම සුළි සුළං, කුණාටු, ගංවතුර වැනි පමණ ඉක්මවා යන සොබා දහමේ අකාරුණික භාවයන් හේතුවෙන් වගා බිම් විනාශ වී ගොස් ධන ධාන්‍ය හිඟව යාමේ තර්ජනයන්ටද මුහුණ පෑමට සිදුවන වාර අනන්තය.". එපමණක්ම නොවේ වසර ගණනාවක සිටම එළඹෙන තර්ජනය පිළිබඳව වාර්ෂික වාර්තාවෙහි පෙරවදනෙහි සටහනක් තැබුවෙමි. එමෙන්ම දෙපාර්තමේන්තු ක්‍රියාකාරිත්වයද ඊට සරිලන තත්ත්වයකින් පවත්වාගෙන යාම උදෙසා අවශ්‍ය සාධක සම්පාදනය කර ගැනීමේ අරමුණින් යුක්ත උපාය මාර්ගික සැලසුම් හා වැය ඇස්තමේන්තු කෙටුම්පත් ඉදිරිපත් කිරීමටද දෙපාර්තමේන්තුව මෙහෙයවන ලදී. එහි අරමුණ වූයේ කාලගුණික විපරීතතාවන් හේතුකොටගෙන දේශයේ වී ගොවිතැන අඩාල වීම හා කුඹුරුපිටි පාලුවීමක් සිදුවූ අවස්ථාවකදී ශක්තිමත් රාජ්‍ය මැදිහත් වීමක් ලබාදිය හැකි ආරක්ෂිත සහල් තොගයක් පවත්වාගෙන යායුතු වන බව මෙම වාර්තාව පරිශීලනය කරන විද්වත් පිරිසගේ අවධානයට යොමු කරවීමේ අරමුණෙනි.

එසේම දෙපාර්තමේන්තුව සතුව පවත්නා අළුත්වැඩියා කළ යුතු තත්වයේ පවත්නා ගබඩා පද්ධතිය විද්‍යාත්මක ක්‍රමවේදයන් අනුගත ගබඩා ක්‍රමවේදයක් යටතේ නවීකරණය කිරීම සඳහා අවශ්‍ය යෝජනා ඉදිරිපත් කළේද ගුණාත්මක සහල් ආරක්ෂිත තොග පවත්වාගෙන යාමේ දැඩි අවශ්‍යතාවක් පැවතුණු නිසාවෙනි.

ආරක්ෂිත තොග සඳහා අවශ්‍ය සහල් මිල දී ගැනීමට අවැසි වු ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ආරක්ෂිත තොග පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම කල් තබන්නට දෙපාර්තමේන්තුවට සිදු විය.

කෙසේ හෝ සහල් ආරක්ෂිත තොගයක් පවත්වාගැනීමේ අපේක්ෂාව මුදුන්පත් කර ගැනීමට පෙරාතුව සොබා දහමේ අකාරුණික තර්ජනයට 2014 වර්ෂයේදී දේශයට මුහුණ පාන්නට සිදුවූ බව නොකිව මනාය . අක්කර දහස් ගණනක කුඹුරු පිටි නියඟයෙන් විනාශ විමෙන් වී අස්වැන්න හිඟවීම හේතුකොටගෙන එදිනෙදා බත

තැනෙන දේශීය සහල් වෙළඳපල ඇහිරීමත්, දේශීය සහල් මිල රජයේ පැවති සහතික මිලද ඉක්මවා ඉහල යාම හේතුවෙන් පැවති සහතික මිලට වඩා ඉහළ මිලක් යටතේ සංශෝධනය කිරීමට සිදුවීමත් වර්ෂයේ කැපී පෙනෙන සංසිද්ධියක් විය. මෙයට පිළියම් වශයෙන් රටතුළ විදේශීය සහල් වෙළඳපළක් බිහිවීම හා සහල් වෙළඳපල තුළ පැවති සැපයුමෙහි සිදුවූ ඌණතාව මගහැරවීම සඳහා අවශ්‍ය රාජ්‍ය මැදිහත් වීම ලබාදීම සඳහා ඇවැසි සහල් පිටරටින් ගෙන එන තත්වයට පත්වූ අතර වසර අවසානයේ ලංකා ස.තො.ස. හා සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පිටරටින් ගෙන්වනු ලැබූ සහලින් මෙ.ටො. 35,000 ක් පමණ ගබඩා කිරීමට අවශ්‍ය ගබඩා පහසුකම් සැලසීම ආහාර දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. මෙම ගබඩා පහසුකම් අතර දෙපාර්තමේන්තුව විසින් විද්‍යාත්මක ක්‍රමවේදයන් අනුගත ක්‍රමවේද යටතේ නවීකරණය කරන ලද මෙ.ටො.5000 ක ධාරිතාවෙන් යුත් ගබඩා දෙකෙන් එකක් ලංකා ස.තො.ස. ආයතනය වෙතද, අනෙක සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වෙතද ලබාදීමට කටයුතු කෙරිණ.

සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගෙන එන ලද තොගය නඩත්තු කිරීම සම්පූර්ණ වශයෙන්ම ආහාර දෙපාර්තමේන්තුව භාරයේ සිදු විය. එය සාමාන්‍ය ගබඩා කිරීමේ නියමිත ප්‍රමිතීන්ට හා විද්‍යාත්මක ක්‍රමවේදයන් අනුගත ගබඩාවන්හි ගබඩා ගත කිරීමේ ක්‍රමවේදයන් යටතේ ගැනෙන ප්‍රමිතීන්ට අනුව ගබඩා කරමින් සෞඛ්‍යාරක්ෂිතව හා ගුණාත්මකව පවත්වාගෙන යන්නට හැකිවීම විද්‍යාත්මක ගබඩා ක්‍රමවේදය යථාර්ථයක් කරලීම සඳහා මනා පිටුවහලක් වූ අතර එය වර්ෂය තුල ලද විශිෂ්ඨ ජයග්‍රහණයක් විය.

ඊට අමතර වශයෙන් දෙපාර්තමේන්තු භාවිතයට නොගැනුණු ගබඩා රාජ්‍ය හා පෞද්ගලික අංශය වෙත රජයේ තක්සේරුකරු විසින් ලබාදෙන ලද තක්සේරුව මත කුලියට දීමත්, ත්‍රිකුණාමලය ධාන්‍යාගම පිහිටි දෙපාර්තමේන්තුව සතු නිවාස, නිවසක් නොමැති රජයේ සේවකයින් වෙත කුලියට දීම හා ප්‍රීමා සමාගමේ සේවකයින් වෙත කුලියට දීමත් මගින් රජයේ ආදායම වර්ධනය සඳහා දායකත්වය දක්වන ලදී.

එසේම ධාන්‍යාගම පිහිටි නිවාස අතර පූර්ව වර්ෂයන්හි කුලියට ලබාගත් පිරිස් විසින් කරන ලද අතුරු බදුදීම් පැවති අවස්ථා 32 ක් හඳුනාගෙන අධිකරණ ක්‍රියාමාර්ග ගනිමින් ඒවායෙහි සන්තකය දෙපාර්තමේන්තුව වෙත ලබාගැනීමටත්, වෙනත් නිවාස ඉල්ලුම් කරුවන් වෙතින් තෝරාගත් අයවලුන් සමග ඇති කරගත් ලිඛිත ගිවිසුම්

හරහා නැවත කුලියට දීමටත්, ප්‍රීමා සමාගමෙහි සේවකයන් වෙත ලබාදී ඇති සියළු නිවාස සඳහා ලිඛිත ගිවිසුම් ඇති කර ගැනීමටත් වර්ෂය තුළ ඉඩකඩ සලසා ගැනීමද, දෙපාර්තමේන්තුව සතු අනෙකුත් ක්‍රියාකාරකම් නිසි පරිදි පවත්වාගැනීමට හැකිවීමද මගින් 2014 වර්ෂය  දෙපාර්තමේන්තු කාර්ය භාරය මනාව ක්‍රියාත්මක වූ වසරක් සේ සැලකීමට හේතුවක් විය.

මෙම කාර්යයන් සියල්ල ඉතාමත් සාර්ථක අන්දමින් පවත්වාගැනීම සඳහා කැපවීමෙන් හා ආකල්ප පෝෂණයෙන් ක්‍රියාත්මක වූ පිරිස් මෙන්ම දෙපාර්තමේන්තු ක්‍රියාකාරිත්වයට අකුල් හෙළීම සඳහාත් දෙපාර්තමේන්තු නාමය පළුදු කිරීම සඳහාත් කටයුතු කළ පිරිස් ද සිටි අතර ඔවුන් විසින් දරන ලද අනිසි  ප්‍රයත්නයන් මත පසුබට නොවී දෙපාර්තමේන්තු මෙහෙවර සාර්ථකව  පවත්වාගෙන යාම සඳහා කැපවීමෙන් යුතුව මා සවිමත් කරන්නට යෙදුණු කාර්ය මණ්ඩලය ස්තුති පූර්වකව සිහිපත් කිරීම මගේ යුතුකම කොට සළකමි. දිනෙන් දින සුරක්ෂිත වන ආහාර සුරක්ෂිතතාවයට අනුකූලව  දෙපාර්තමේන්තුවේ මෙහෙවර ඔස්සේ  සිංහලයේ ඇල් සහලින් දේශයේ ජනතාවගේ අහර කිස තනන්නට ඇවසි වියෙන්, සහලින්, දෙපාර්තමේන්තු ගබඩා පුරවාලන්නට හැකි හෙට දිනක  අපේක්ෂාව යථාර්ථයක්ම වේවා යන්න මාගේ හෘදයාංගම ප්‍රාර්ථනය වේ.



එන්. නිමල්කා ඩයස්
ආහාර කොමසාරිස්
2015 මාර්තු මස 30  වන දින

යූනියන් පෙදෙස,
කොළඹ 02,
ආහාර දෙපාර්තමේන්තුවේදීය.

# පටුන

1. ආහාර දෙපාර්තමේන්තුව දැක්ම මෙහෙවර......................07

2. වැඩිදියුණු කළ සහල් ගබඩාකරණය සඳහා DIBSS ව්‍යාපෘතිය......08 - 10

3. ආහාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ...................11

4. සංවිධාන ව්‍යුහය - ආහාර දෙපාර්තමේන්තුව.....................12

5. පාලන ව්‍යුහය හා කාර්යය මණ්ඩලය...........................13 - 16

6. විගණන හා විනය පාලන කටයුතු.............................17

7. නීතිමය කටයුතු..........................................18

8. දෙපාර්තමේන්තුව සතු ගබඩා සහ නිවාස......................19 - 27

9. ගිණුම් ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචනය.......................28-29

10. වත්කම් හා දේපල........................................30

11. ආදායම් සහ අයවැය......................................31

12. මූල්‍ය වාර්තා..........................................32- 34

13. ක්‍රියාකාරීත්වය හා ප්‍රගතිය..................................35-36

# (01). අප ගැන........

## ■ දැක්ම

"ආරක්ෂිතව, අඛණ්ඩව, පෝෂ්‍යදායී ධාන්‍යමය ආහාර සෑම නිවසකටම".

## ■ මෙහෙවර

"ධාන්‍යමය ආහාර ද්‍රව්‍යයන්හි වෙළඳපොළ සුලභතාව, පාරිභෝගිකයාට ළඟා වීමේ පහසුව සහ පාරිභෝගික මිලදී ගැනීමේ හැකියාව සුරක්ෂිත කිරීම උදෙසා ආහාර දෙපාර්තමේන්තුව හා සම්බන්ධ පාර්ශව, දෙපාර්තමේන්තුව සතු වත්කම් සහ කාර්යක්ෂම වූත්, කැපවූත් සේවක සමූහයා සමඟ මනා ලෙස සම්බන්ධීකරණය මගින් ආහාර දෙපාර්තමේන්තුවේ දැක්ම සාක්ෂාත් කර ගැනීම".

# (02) වැඩිදියුණු කළ සහල් ගබඩාකරණය සඳහා DIBSS ව්‍යාපෘතිය.

දෙපාර්තමේන්තුවට පැවරුණු කාර්ය භාරයෙහි කාලානුරූපව සිදු වූ වෙනස්කම් සමග අද වන විට පහත දැක්වෙන තත්ත්වයන් යටතේ සහල් ආරක්ෂිත තොග පවත්වා ගැනීම ප්‍රමුඛ කාර්ය භාරය බවට පත්ව ඇත.

- කොළඹ සාර්ක් ප්‍රඥප්තිය අනුව සාර්ක් කලාපීය රටවල අවශ්‍යතා සඳහා මෙට්‍රික් ටොන් 8000 ක විශේෂ සහල් ආරක්ෂිත තොගයක් පවත්වා ගැනීම .
- 2008.08.27 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අනුව මෙට්‍රික් ටොන් 100,000ක (ලක්ෂයක) සහල් ආරක්ෂිත තොගයක් පවත්වා ගැනීම .

සහල් වෙළඳපලෙහි සැපයුමේ ඌනතාවයන් මත සිදුවන මිල ඉහළ යාම පාලනය කිරීම හා එමගින් වෙළඳපොළ සහල් මිල ස්ථායිව පවත්වා ගෙන යාමද පූර්වේක්ෂණය කළ නොහැකි ස්වාභාවික විපත්ති අවස්ථාවල ඇති වන හදිසි ආහාර අවශ්‍යතා සපුරාලීම ද සහල් ආරක්ෂිත තොගයක් පවත්වා ගැනීමේ ප්‍රධාන අරමුණු වේ. මෙම කාර්යය සාක්ෂාත් කරගනු පිණිස දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකම ව්‍යාප්ත වූ මෙට්‍රික් ටොන් 250,000 ධාරිතාවයකින් යුත් ගබඩා 114 ක් දෙපාර්තමේන්තුව සතුව පවතී.

මෙලෙසින් පවත්වාගෙන යනු ලබන සහල් ආරක්ෂිත තොගයක ගබඩාගත කාලය නිශ්චිතව තීරණය කළ නොහැකි අතර මාස 3 කට වැඩි වසරකට අඩු කාලයක් විය හැකිය. එහෙත් නිවර්තන කලාපීය රටක් වන ශ්‍රී ලංකාවේ අධික වර්ෂාපතනයක් පවතින අතර එම කාල වලදී වැඩි ආර්ද්‍රතාවයක්ද වැසි රහිත කාල වලදී අධික උෂ්ණත්වයක්ද දක්නට ලැබේ. මෙවැනි තත්ත්වයන් තුල ක්ෂුද්‍ර ජීවීන් සහ කෘමි සතුන් බෝවීම ඉතාමත් වේගයෙන් සිදුවන අතර ගබඩා ගත තොගයන්ටද එමගින් එල්ල වනුයේ දැඩි බලපෑමකි. මෙම තත්වය හා දිලීර ආසාධන තුලින් සිදුවන සහල් දිරාපත් වීම මත සහල් තොග මිනිස් පාරිභෝජනයට නුසුදුසු තත්වයට පත්වීම සිදුවේ. එය සහල් ආරක්ෂිත තොග පවත්වාගෙන යාමට විශාල බාධාවක් වන බව පැවති භෞතික හා ප්‍රායෝගික තත්වයන් යටතේ දෙපාර්තමේන්තුව මගින් නිරීක්ෂණය කරන ලදී.

ඒ අනුව සහල් වසරක කාලයක් පළිබෝධක හානි සහ දිලීර ආසාධන වලින් තොරව පවත්වාගැනීමට රසායනික භාවිතයෙන් තොර ක්‍රමවේදයක් හඳුනාගැනීම සඳහා එකම දේශගුණික කලාපයක පිහිටි ඉන්දියාව වැනි රටවල් භාවිතා කරනු ලබන ක්‍රමවේද හා ක්ෂේත්‍රයෙහි විද්වතුන්ගේ සහභාගිත්වයෙන් සිදුකරන ලද අධ්‍යයනයකට අනුව විද්‍යාත්මකව ගබඩාව තුල ජනිත වන උෂ්ණත්වය හා ආර්ද්‍රතාව සහල් වල කල්පැවැත්මට හිතකර තත්ත්වයට පත් කිරීම තුලින් පහත දැක්වෙන ක්‍රමවේදයන් භාවිත කොටගෙන සහල් තොග කල්පවත්වා ගැනීම සඳහා සුදුසු පරිසරයක් ගබඩාව තුල නිර්මාණය කළ හැකි බව හඳුනාගැණින.

1) යාන්ත්‍රික වායු සංසරණ ක්‍රමවේදය.

2) ස්වභාවික වායු සංසරණ ක්‍රමවේදය.

මෙම ක්‍රමවේදයන් දෙක පර්යේෂණාත්මක ගබඩා ආදර්ශණයක් මගින් අත්හදා බැලීම සඳහා සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යවරයාගේ හා අමාත්‍යංශ ලේකම් වරයාගේ උපදෙස් හා අනුමැතිය පරිදි හා මුදල් අමාත්‍යාංශ ලේකම් වරයා විසින් ගබඩා අළුත්වැඩියාව සඳහා වැය ඇස්තමේන්තු මගින් ලබාදෙන ලද ප්‍රතිපාදන භාවිත කොට විද්‍යාත්මක ක්‍රමවේදයන් අනුගත පර්යේෂණාත්මක ගබඩා ආදර්ශණයක් ලෙස වේයන්ගොඩ දිසා ධාන්‍යාගාරයේ පැවති ගබඩාවක් 2012 වසරේදී නවීකරණය කරන ලදී.

**<u>යාන්ත්‍රික වායු සංසරණ ක්‍රමෙව්දය</u>**

ශීත කාරක යන්ත්‍ර පද්ධතියක් හා තාප බාධක සීලිමක් ගබඩාවට අනුගත කොට පලිබෝධකයින්ගේ වැඩීමට හිතකර නොවන උෂ්ණත්වයක් සහ දිලීර ආසාධන වර්ධනය වීමට හිතකර නොවන ආර්ද්‍රතාවයක් ගබඩාව තුල පවතින පරිදි උෂ්ණත්වය හා ආර්ද්‍රතාව අවශ්‍ය මාපාංක යටතේ පාලනය කිරීම.

**<u>ස්වභාවික වායු සංසරණ ක්‍රමවේදය.</u>**

යන්ත්‍ර පද්ධතියකින් තොරව පිටකුරු පංකාව (exsource Fan) භාවිතයෙන් ගබඩාව තුල ජනිත වන උණුසුම් වාතය ගබඩාවෙන් පිටස්තර අවකාශයට මුදාහැරීම සහ බාහිර අවකාශයේ පවත්නා සිසිල් වාතය ගබඩාව තුලට ඇතුළු කිරීමත් තුලින් ගබඩාව තුල පැවතිය යුතු උෂ්ණත්වය හා ආර්ද්‍රතාව පවත්වාගැනීම මෙම ක්‍රමවේදය මගින් සිදු කරනු ලැබේ.

මෙම ක්‍රමවේදයන් අනුගත කරමින් නවීකරණය කරන ලද ගබඩාවේ සහල් ගබඩා කිරීම 2012 ඔක්තෝබර් මාසයේ සිදු කරන ලද අතර ඒ සඳහා විශේෂිත අට්ටි ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබිණි. සෑම සහල් උරයකටම හොඳින් වාතාශ්‍රය ලැබෙන පරිදි සකසන ලද මෙම අට්ටි ක්‍රමය හේතුවෙන් සහල් අට්ටිය තුල උණුසුමක් ඇතිවීම පාලනය කරන ලද අතර රසායනික භාවිතය අවම කරන ලදි. මේ අනුව ගබඩා ගත කරන ලද මෙ.ටො.661.5 සහල් ආරක්ෂිත තොගය 2013 ඔක්තෝබර් මාසය දක්වාම ගුණාත්මකව පැවතුනු අතර විද්‍යාත්මක ක්‍රමවේදයන් අනුගත කිරීමේ පර්යේෂණ අදියර මගින් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකියාව පවතින බව නිගමනය විය. එය විශාල ජයග්‍රහණයක් මෙන්ම අනාගතයේදීද සහල් ආරක්ෂිත තොග පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පැවති බාධාකාරී තත්වයට ගුණාත්මක පිළිතුරක් විය.

ඒ අනුව මෙම පර්යේෂණ අදියර තුලින් සාක්ෂාත් කර ගත හැකි වූ අරමුණු කිහිපයකි.

1. සහල් වල පැවතිය යුතු සම්මත ගුණාංගයන් සහිත සහල් පමණක් ගබඩා ගත කිරීම.

2. පළිබෝධක හා දිලීර ආසාධන වලින් තොරව සහල් ආරක්ෂිත තොගයක් වසරක කාලයක් පවත්වා ගැනීම.

3. තොග පවත්වාගෙන යාමේදී අදාල කරගනු ලබන රසායනික භාවිතය අවම කිරීම.

4. තොග හානි හා අපතයන් අවම කිරීම.

5. සහල් තොග පිරිසිදුව හා සෞඛ්‍යාරක්ෂිතව පවත්වාගෙන යාමට හැකිවීම.

6. ගුණාත්මක සහල් වෙළඳපලට නිකුත් කිරීමට හැකිවීම මගින් වසෙන් විසෙන් තොර ගුණාත්මක සහල් වෙළඳපළක් බිහි කිරීමට දායකත්වය ලබාදීම.

7. කුඩා පරිමාණ සහල් මෝල් හිමියන්ගේ නිෂ්පාදන මිලදී ගෙන ගබඩා කර තැබීම සඳහා රාජ්‍ය දායකත්වය ලබාදීමට හැකිවීම.

8. අපනයනය සඳහා සුදුසු සහල් තොග පවත්වාගෙන යාමට හැකිවීම.

මෙම ගබඩාවන්හි ගබඩා ගත කරන ලද පර්යේෂණාත්මක සහල් තොගය වෙළඳපලට නිකුත් කිරීම 2013 දෙසැම්බර් මාසයේ සිදුකරන ලද අතර 2014 වර්ෂයේ මාර්තු මස අවසන් වන විට සම්පූර්ණයෙන්ම නිකුත් කර අවසන් කරන ලදී.

මෙම සහල් නිකුතුව මගින් රු. 3,343,794.00 ක ශුද්ධ ලාභයක් රජයේ ආදායමට එකතු කිරීමට හැකිවීම විද්‍යාත්මක ක්‍රමවේද අනුගත ගබඩාවන්හි සහල් ආරක්ෂිත තොග ගබඩාකරණයෙහි සාර්ථකත්වය නිරූපණය වීමක් මෙන්ම 2014 වර්ෂයේ දෙපාර්තමේන්තු ක්‍රියාකාරිත්වයේ කැපී පෙනෙන සිදුවීමක්ද විය.

# (03).ආහාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්

**01.දකුණු ආසියාතික කලාපීය රටවල සහයෝගිතා සංවිධානයේ (SAARC) කොළඹ ප්‍රඥප්තිය හා 16 වන සමුළු රැස්වීමට අනුව මෙ.ටො. 8000 ක විශේෂිත සහල් සංචිතයක් පවත්වාගෙන යාම.**

දකුණු ආසියාතික කලාපීය රටවල හදිසි හා ආපදා සහිත අවස්ථාවලදී ප්‍රයෝජනයට ගතහැකිවන පරිදි මෙ.ටො.8000 ක සහල් සංචිතයක් ශ්‍රී ලංකාව විසින් පවත්වාගෙන යා යුතු බව එකී සංවිධානයේ 16 වන සමුළුවේ දී තීරණය කර ඇත.

**02. 2008/8/27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව දිවයින පුරා පවතින ආහාර දෙපාර්තමේන්තුව සතු ගබඩාවල මෙ.ටො.100,000 ක ආරක්ෂිත සහල් සංචිතයක් පවත්වාගෙන යාම.**

2008/8/27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව අර්බුධකාරී අවස්ථාවන්හි දී ප්‍රයෝජනයට ගැනීම සඳහා මෙ.ටො.100,000 ක සුරක්ෂිත සහල් සංචිතයක් පවත්වාගෙන යාමේ අරමුණින් යුතුව ආහාර දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගතකොට ඇත.

**03. වෙළඳපොළ සහල් සුලභතාවය පිළිබඳ සහතික වීම**

වෙළඳපොළ සහල් හිඟයන් ඇතිවීම තුළින් ඇතිවිය හැකි මිල උච්ඡාවචනයන් පාලනය කිරීම සඳහා අත්‍යාවශ්‍ය අවස්ථාවන්හි දී වෙළඳපොළට තොග මුදා හැරීමෙන් සහල් මිල දි ගැනීමේ හැකියාව පාරිභෝගිකයා වෙත ලබා දීම.


**04. ආයතනයේ සම්පත් මනා කළමනාකරණය සඳහා අදාළ පාර්ශවයන් (Stake holders) සමඟ මනා සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම.**

දෙපාර්තමේන්තුව සතු ගබඩාවන් සහ නිවාස මනා උපයෝගිතාවයකට ලක් කිරීම සඳහා අතිරික්ත ගබඩා හා නිවාස ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව පදනම්කොට කුළියට ලබා දීමෙන් රාජ්‍ය ආදායමට දායකත්වයක් දැක්වීම.

**05. කෘමි උවදුරුවලින් තොර ධාන්‍යමය ආහාර ගබඩා පරිසරයක් ඇති කිරීම.**

ඉහළ ගුණත්වයෙන් යුතු ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා පළිබෝධ උවදුරෙන් තොර ගබඩාවන් පවත්වාගෙන යාම තුළින් පාරිභෝගිකයා වෙත ගුණත්වයෙන් ඉහළ ධාන්‍යමය ආහාර සැපයීම.

# 04.සංවිධාන ව්‍යුහය


ආහාර කොමසාරිස්
නියෝජ්‍ය ආහාර කොමසාරිස්
ප්‍රධාන ගණකාධිකාරී
නීති නිලධාරී
සහකාර ආහාර කොමසාරිස්
ගණකාධිකාරී
පරිපාලන නිලධාරී
තත්ත්ව පාලන නිලධාරී
වැඩ පරීක්ෂක
නීති අංශය
සැපයුම් අංශය
පාලන අංශය
ප්‍රවාහන අංශය
තොරතුරු තාක්ෂණ අංශය
තත්ත්ව පාලන අංශය
ගිණුම් අංශය

# (05). පාලන ව්‍යූහය හා කාර්යය මණ්ඩලය

## ■ පාලන ව්‍යූහය :

ආහාර කොමසාරිස් විසින් ක්‍රියාත්මක කළ පරිපාලන හා මෙහෙයුම් වැඩ සටහන්, ක්‍රියාකාරී අන්දමින් සිදුවෙමින් පැවතිණි.

2014 වසර සඳහා දෙපාර්තමේන්තුවේ සියලුම ගිණුම් කටයුතු, ගණකාධිකාරීවරිය විසින්ම සිදු කරන ලදි.

ත්‍රිකුණාමලය නිවාස 366 කළමනාකරණය සඳහා ස්ථානභාර නිළධාරී කටයුතු කරන ලදි. වේයන්ගොඩ දිසා ධාන්‍යාගාරයේ කළමනාකරණය සඳහා වේයන්ගොඩ ස්ථානභාර නිළධාරී කටයුතු කරන ලදි.

දෙපාර්තමේන්තුවේ නීති අංශය පෙර වර්ෂයේ පරිදිම අමාත්‍යාංශයේ නීති උපදේශකගේ වැඩ බැලීම මත කටයුතු කරන ලදි.


රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අනුමත තනතුරු 82 සඳහා I, II, III පංතිවලට අයත් නිළධාරී මහත්ම මහත්මීන් 30 දෙනෙකු ද විවිධ තනතුරුවලට අයත් අනුමත දෙපාර්තමේන්තු ගත සේවක තනතුරු 81 සඳහා සේවකයින් 56 දෙනෙකු ද ඇතුළුව මුළු අනුමත සේවක සංඛ්‍යාව වූ 225 සඳහා 2014.12.31 දිනට කාර්යය මණ්ඩලයේ 114 දෙනෙකු සේවයේ යෙදී ඇත.

2014.01.01 දිනට සේවයේ සිටි මුළු සේවක සංඛ්‍යාවෙන් 6% ක් වසර තුළදී විශ්‍රාම ගැනීම සිදුවිය. එසේම නව රාජ්‍ය කළමනාකරණ සහකාර නිළධාරීන් 03 ක්, කාර්යාල සේවක සේවය සඳහා නවක සේවක මහතුන් 05ක් සහ නව රියදුරු මහතුන් 02ක් 2014 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවට ලැබී ඇත.

## ■ 2014 ආහාර දෙපාර්තමේන්තුවේ සේවක මණ්ඩලය

| | තනතුරු නාමය | අනුමත සංඛ්‍යාව | 2014.12.31 දිනට සේවයේ නියුතු |
|---|---|---|---|
| **01** | ආහාර කොමසාරිස් | 01 | 01 |
| **02** | නියෝජ්‍ය ආහාර කොමසාරිස්/ සහකාර ආහාර කොමසාරිස් | 02 | 01 |
| **03** | ගණකාධිකාරි | 02 | 01 |
| **04** | පරිපාලන නිලධාරි | 01 | - |
| **05** | භාෂා පරිවර්තක | 01 | - |
| **06** | තත්ත්ව පාලන නිලධාරී | 01 | - |
| **07** | ධාන්‍ය සමීක්ෂක | 01 | - |
| **08** | වැඩ පරීක්ෂක | 01 | 01 |
| **09** | තොරතුරු හා සන්නිවේදන සහකාර | 01 | - |
| **10** | රාජ්‍ය කළමනාකරණ සහකාර | 82 | 30 |
| **11** | සංවර්ධන නිළධාරි | 22 | 07 |
| **12** | වාප්පු ක්ෂේත්‍ර සේවය | 08 | 08 |
| **13** | රියදුරු | 10 | 08 |
| **14** | කාර්යාල සේවක සේවය | 22 | 14 |
| **15** | ධූමායනකරු | 26 | 14 |
| **16** | රිය සහකරු | 02 | 11 |
| **17** | වාප්පු ක්ෂේත්‍ර කම්කරු | 01 | 01 |
| **18** | මුරකරු | 17 | 17 |
| **19** | ගබඩා කම්කරු | 24 | - |
| **එකතුව** | | **225** | **114** |

- 2014 ආහාර දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව හා සේවයේ නියුතු සේවක සංඛ්‍යාව



## I. නව පත්වීම්

| # | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| I. | රාජ්‍ය කළමනාකරණ සහකාර | 03 |
| II. | කාර්යාල සේවක සේවය | 05 |
| III. | රියදුරු | 02 |

## II. නව බඳවා ගැනීම්

| # | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| I. | ආදේශක මුරකරු | 02 |

## III. විශ්‍රාම ගැන්වීම්

| # | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| I. | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 03 |
| II. | ධූමායන කම්කරු /ධූමායන යන්ත්‍ර ක්‍රියාකරු | 02 |
| III. | රිය සහායක | 01 |
| I V | මුරකරු | 01 |

## IV. ස්ථාන මාරු වී යාම්

| # | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| I. | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 07 |
| II | රියදුරු | 01 |

## V. ස්ථාන මාරු වී පැමිණීම්

| # | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| I. | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 01 |
| II | රියදුරු | 01 |

## VI. දෙපාර්තමේන්තු සේවයෙන් මුදා හැරීම්

| # | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| I. | වාප්පු ක්ෂේත්‍ර නිළධාරි | 02 |
| II | රියදුරු | 01 |

# (06). විගණන හා විනය පාලන කටයුතු

## ■ විගණනය :

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන කාර්යය මණ්ඩලයෙන් සමන්විත රජයේ විගණන අංශයක් දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කර ඇත. එමගින් අවශ්‍ය අවස්ථාවන්හි දී කරනු ලබන විගණනයන්ට අමතරව අවසන් ගිණුම් විගණන කටයුතු ද සිදු කෙරේ.

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සමූපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් මෙහෙයවනු ලැබූ අතර විගණකාධිපතිවරයා විසින් හා දෙපාර්තමේන්තු පරිශ්‍රයේ පිහිටි, රජයේ විගණන අංශය වෙතින් එවනු ලබන විගණන විමසුම් සඳහා වන පිළිතුරු අමාත්‍යාංශය වෙත පිටපත් සහිතව අදාළ පාර්ශ්වයන් වෙත සෘජුවම යැවීමට කටයුතු කර ඇත.

ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත 2014 වසරේ දෙසැම්බර් මස 31 වන දින විට විගණන විමසුම් 15 ක් ලැබී ඇති අතර ඉන් 13 ක් සඳහා පිළිතුරු ලබා දී ඇත.

## ■ විනය පාලන කටයුතු :

2014 වර්ෂයේ දී නිළධාරියකුට එරෙහිව විධිමත් විනය පරීක්ෂණයක් පවත්වන ලදී.

# (07). නීතිමය කටයුතු

2014 වසරේ අවසානය වන විට ආහාර දෙපාර්තමේන්තුව විසින් යෙදී සිටි නීතිමය කටයුතු සම්බන්ධ තොරතුරු පහත පරිදි වේ.

| # | ස්වභාවය | නීතිමය කටයුතු සංඛ්‍යාව |
|---|---|---|
| I. | අගරු චෙක්පත් මුදල් අයකර ගැනිම | 02 |
| II. | හිඟ ගබඩා කුලී අය කර ගැනීම | 04 |
| III. | ගබඩා සන්තකය ලබාගැනීම | 01 |
| IV. | අධිභාර අයකර ගැනීම | 05 |
| V. | ත්‍රිකුණාමලය ධාන්‍යගම නිවාසවල සන්තකය පවරා ගැනීමේ නඩු | 09 |
| | **එකතුව** | **21** |

- ඔරුගොඩවත්ත 10,14,16 වන්දි නඩුව-නඩු අංක DMR/01815 යටතේ නඩුව විභාග විය. ඇස්කීසි ක්‍රියාත්මක කර වන්දි මුදල වන රු1,028,500.00 ක මුදල අයකර ගැනීමට නඩු තීන්දුව ලබා දී ඇත. අදාල ලිපිනයේ එවැනි ආයතනයක් නොමැති බව පිස්කල් අධිකරණයට වාර්තා කර ඇත.
- වැලිසර අංක 05- ගෙවිය යුතු හිඟ මුදල වන රු 910,602.91 ක මුදලින් රු250,000.00 ක මුදලක්ද, රු50,000.00 බැගින් වාරික 02 ක්ද ගෙවා ඇත. ඉතිරි වාරික හිඟයකින් තොරව ගෙවන ලෙස අදාළ අය හට දන්වා යවා ඇත.
- මාතර මැද්දවත්ත, බදුල්ල හා නාරාහේන්පිට ගබඩා- ශ්‍රී ලංකා පාරිභෝගික සමු.සමිතිය-හිග ගබඩා කුලිය වන රු3,340,715.06 ක මුදල වාරික 18 කින් ගෙවීමට එකග වී DMR/03128/08 දරන නඩුව සමථයකට පත් විය .දැනට රු2,015,708.85 ක මුදලක් ගෙවා ඇත. තවත් රු1,325,006.21 ක මුදලක් ගෙවීමට ඇත.
- වේයන්ගොඩ අංක 11- දොන් මියෝන්ග් (පුද්) සමාගම- නඩු අංක DMR/03546/10 අනුව ගෙවිය යුතු හිග ගබඩා කුලියට අදාලව විත්තිකරු විසින් රු2,500,000.00 ක මුදලක් ගෙවීමෙන් අනතුරුව නඩුව අවසන් කර ගෙන ඇත.
- ත්‍රිකුණාමලය ධාන්‍යගම නිවාස සංකීර්ණයේ නිවාස 34 ක සන්තකය 2014 වර්ෂයේදි අධිකරණය මගින් දෙපාර්තමේන්තුව ලබා දී ඇත.
- තවද 2014 සැප්තැම්බර් මස දී ධාන්‍යගම නිවාස සංකිර්ණයේ නිවාස 182 ක් සඳහා ප්‍රීමා සමාගමේ සේවකයින් සමග ගිවිසුම් අත්සන් කරන ලදි.

# (08). දෙපාර්තමේන්තුව සතු ගබඩා සහ නිවාස

## ■ දෙපාර්තමේන්තුව සතු ගබඩා :

ආහාර දෙපාර්තමේන්තුව සතු ගබඩා දිස්ත්‍රික්ක 22ක පිහිටා ඇති අතර සංඛ්‍යාත්මකව එය 114 කි. රාජ්‍ය දේපළ මනාව කළමනාකරණය කිරීමේ අදහසින් එම දේපළ පහත පරිදි කාර්යයන්හි යොදවා ඇත.

| # | ගබඩා | සංඛ්‍යාව |
|---|---|---|
| 1. | රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත මාසික කුලී පදනම මත ලබා දී ඇති ගබඩා | 49 |
| 2. | කුලී රහිතව රාජ්‍ය අංශයේ ආයතන වෙත ලබා දී ඇති ගබඩා | 35 |
| 3. | ආහාර දෙපාර්තමේන්තුව භාවිතා කරන ගබඩා | 17 |
| 4. | දිස්ත්‍රික් ලේකම්/ප්‍රා.ලේකම් භාරයේ ඇති ගබඩා | 13 |
| | **එකතුව** | **114** |

## ■ දෙපාර්තමේන්තුව සතු නිවාස :

ආහාර දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන නිවාස 366 ක් ත්‍රිකුණාමලයේ, චීන වරායේ, ධාන්‍යගම පිහිටා ඇති අතර එම නිවාස පහත සඳහන් පරිදි භාවිතයට ගනු ලැබේ.

| # | **2014.12.31** දිනට භාරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1. | ආහාර දෙපාර්තමේන්තු කාර්යාලය | 01 |
| 2. | සංචාරක නිවස | 01 |
| 3. | අයදුම්කරුවන් වෙත ලබාදීමට නියමිත | 08 |
| 4. | **කුළියට ලබා දුන්** | |
| • | ප්‍රීමා ආයතනයේ සේවකයින් සඳහා | 182 |
| • | පෞද්ගලික ආයතන සඳහා | 01 |
| • | රාජ්‍ය ආයතන නිළධාරීන් සඳහා | 81 |
| • | ත්‍රිවිධ හමුදාව හා පොලිසිය | 44 |
| • | අර්ධ රාජ්‍ය ආයතන සඳහා | 48 |
| | **එකතුව** | **366** |

## ❖ ආහාර දෙපාර්තමේන්තුව සතු ගබඩා විස්තරය

2014.12.31 දිනට දෙපාර්තමේන්තුව භාරයේ හා දැනට කුලී රහිතව හෝ කුලියට දී ඇති ගබඩා සම්බන්ධ වාර්තාව පහත දක්වා ඇත.

| අනු අංකය | ගබඩාවේ නම | වර්ග අඩි ප්‍රමාණය | ධාරිතාව මෙ.ටො. | කුලියට දී ඇති ආයතනය |
|---|---|---|---|---|
| **කොළඹ දිස්ත්‍රික්කය** | | | | |
| 01 | ඔරුගොඩවත්ත - 01 | 24624 | 6000 | ශ්‍රී ලංකා රේගුව |
| 02 | ඔරුගොඩවත්ත - 02 | 24624 | 6000 | පුනරුත්තාපන අමාත්‍යංශය |
| 03 | ඔරුගොඩවත්ත - 03 | 20304 | 5000 | අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තමේන්තුව |
| 04 | ඔරුගොඩවත්ත - 04 | 19008 | 5000 | පුනරුත්තාපන අමාත්‍යංශය |
| 05 | ඔරුගොඩවත්ත - 05 | 19008 | 4500 | අයිකොන් ඩිස්ට්‍රිබියුටර්ස් |
| 06 | ඔරුගොඩවත්ත - 06 | 20304 | 5000 | අධ්‍යාපන සේවා අමාත්‍යංශය |
| 07 | ඔරුගොඩවත්ත - 07 | 20304 | 5000 | ආපදා සහන දෙපාර්තමේන්තුව |
| 08 | ඔරුගොඩවත්ත - 08 | 16560 | 4000 | අධ්‍යාපන සේවා අමාත්‍යංශය |
| 09 | ඔරුගොඩවත්ත - 09 | 16560 | 4000 | පුනරුත්තාපන අමාත්‍යංශය |
| 10 | ඔරුගොඩවත්ත - 12 | 18183 | 4000 | ශ්‍රී ලංකා රේගුව |
| 11 | ඔරුගොඩවත්ත - 10 | 13436 | - | රැන්ක් කන්ටේනර්ස් ටර්මිනල්ස් (පුද්.) සමාගම |
| 12 | ඔරුගොඩවත්ත - 14 | 11448 | - | |
| 13 | ඔරුගොඩවත්ත - 15 | 18206 | - | |
| 14 | ඔරුගොඩවත්ත - 16 | | - | |
| 15 | කාර්යාල ගොඩනැගිල්ල | - | - | |
| 16 | හුණුපිටිය කාර්යාල කාමරය | 755 | - | සුනීතා ගුණසිංහ මිය |
| 17 | රත්මලාන 03 | 41200 | 7520 | රතු කුරුස සමාජය |
| **එකතුව** | | **284524** | **56020** | |

| අනු අංකය | ගබඩාවේ නම | වර්ග අඩි ප්‍රමාණය | ධාරිතාව මෙ.ටො. | කුලියට දී ඇති ආයතනය |
|---|---|---|---|---|
| **ගම්පහ දිස්ත්‍රික්කය** | | | | |
| 18 | වේයන්ගොඩ - 01 | 29040 | 5900 | ලංකා සතොස |
| 19 | වේයන්ගොඩ - 02 | 21750 | 4000 | ජීබල් හොල්ඩින්ස් (පුද්.) සමාගම |
| 20 | වේයන්ගොඩ - 03 | 6142 | 1200 | ආහාර දෙපාර්තමේන්තුව |
| 21 | වේයන්ගොඩ - 04 | 7552 | 900 | බණ්ඩාර ඉන්ඩස්ට්‍රියල් සර්විසස් |
| 22 | වේයන්ගොඩ - 05 | 12373 | 1400 | සංස්කෘතික කටයුතු දෙපා. |
| 23 | වේයන්ගොඩ - 06 | 7568 | 1100 | ආහාර දෙපාර්තමේන්තුව |
| 24 | වේයන්ගොඩ - 07 | 28860 | 5400 | |
| 25 | වේයන්ගොඩ - 08 | 28860 | 5400 | ලංකා සතොස |
| 26 | වේයන්ගොඩ - 09 | 28860 | 5400 | සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව |
| 27 | වේයන්ගොඩ - 10 | 28860 | 5400 | ලංකා සතොස |
| 28 | වේයන්ගොඩ - 11 | 33200 | 6200 | දොන් මියොන් ආයතනය |
| 29 | වේයන්ගොඩ - 13 | 24288 | 6800 | ලංකා සතොස |
| 30 | වේයන්ගොඩ - 16 | 6370 | 1200 | ලංකා සතොස |
| 31 | වේයන්ගොඩ - 17 | 6279 | 770 | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශය |
| | **එකතුව** | **270002** | **51070** | |
| **කුරුණෑගල දිස්ත්‍රික්කය** | | | | |
| 32 | නිකවැරටිය ගබඩාව | 10496 | 4000 | ප්‍රා.ලේ (නිකවැරටිය) |
| 33 | අස්වැද්දුම ගබඩාව | 6132 | - | වයඹ පළාත් සභාව |
| 34 | මහව අංක - 01 | 4698 | 800 | ආහාර දෙපාර්තමේන්තුව |
| 35 | මහව අංක - 02 | 13118 | 1300 | |
| 36 | මල්කඩුවාව අංක - 01 | 5227 | 2000 | ෂෙයිඩ් මොහොමඩ් සමාගම |
| 37 | මල්කඩුවාව අංක - 02 | 4827 | 2000 | |
| 38 | මල්කඩුවාව අංක - 03 (GI) ගබඩාව | 10498 | 2000 | නිකවැරටිය ග්‍රීන්වැලි ප්ලාන්ටේෂන්ස් පුද් සමාගම |
| 39 | ගැට්ටුවාන අංක - 01 | 6336 | 2000 | වී අලෙවි මණ්ඩලය |
| 40 | ගැට්ටුවාන අංක - 02 | 5544 | 2000 | සෙලින් එක්ස්පෝර්ට් |
| 41 | ගැට්ටුවාන අංක - 03 | 5544 | 2000 | ස.තො.ස |
| 42 | ගැට්ටුවාන අංක - 04 | 5544 | 2000 | |
| | **එකතුව** | **77964** | **20100** | |


| අනු අංකය | ගබඩාවේ නම | වර්ග අඩි ප්‍රමාණය | ධාරිතාව මෙ.ටො. | කුලියට දී ඇති ආයතනය |
|---|---|---|---|---|
| **මහනුවර දිස්ත්‍රික්කය** | | | | |
| 43 | පල්ලෙකැලේ | 15484 | 1500 | එච්.එම්.එස්. ධර්මසේන |
| 44 | කටුගස්තොට ගබඩාව | 6490 | 1700 | ට්‍රෙන්ඩ්ස් මාර්කටින් |
| 45 | වත්තේගම ගබඩාව | 5120 | 1000 | ආහාර දෙපාර්තමේන්තුව |
| | **එකතුව** | **27094** | **4200** | |
| **කෑගල්ල දිස්ත්‍රික්කය** | | | | |
| 46 | කෑගල්ල - පරගම්මන 01 | 5500 | 1500 | විජිත ග්‍රෑප් කම්පැණි ලිමිටඩ් |
| 47 | කෑගල්ල - පරගම්මන 02 | 5500 | 1500 | |
| 48 | කෑගල්ල - පරගම්මන 03 | 3960 | - | |
| | **එකතුව** | **14960** | **3000** | |
| **ගාල්ල දිස්ත්‍රික්කය** | | | | |
| 49 | බූස්ස අංක - 02 | 23721 | 3750 | ආහාර දෙපාර්තමේන්තුව/කොටසක් ලංකා සතොස |
| 50 | බූස්ස අංක - 03 | 23721 | 3750 | ආහාර දෙපාර්තමේන්තුව |
| 51 | බූස්ස අංක - 04 | 56784 | | ආර්ථික මධ්‍යස්ථානය |
| 52 | බූස්ස අංක - 05 | 55770 | | |
| 53 | කටුගොඩ අංක - 01 | 20545 | 3825 | ට්‍රයිකෝ මෙරිටයිම් |
| 54 | කටුගොඩ අංක - 02 | 9532 | 1775 | |
| | **එකතුව** | **190073** | **13100** | |
| **මාතර දිස්ත්‍රික්කය** | | | | |
| 55 | මැද්දවත්ත අංක - 01 | 7264 | 965 | වී අලෙවි මණ්ඩලය |
| 56 | මැද්දවත්ත අංක - 02 | 10000 | 1870 | ආහාර දෙපාර්තමේන්තුව |
| 57 | වැලිගම ගබඩාව | 8019 | 1300 | පියසිරි ස්ටෝර්ස් |
| | **එකතුව** | **25283** | **4135** | |
| **හම්බන්තොට දිස්ත්‍රික්කය** | | | | |
| 58 | හම්බන්තොට ගබඩාව | 14023 | 4500 | වී අලෙවි මණ්ඩලය |
| 59 | වීරවිල අංක - 01 | 5478 | 1700 | ප්‍රා.ලේ (හම්බන්තොට) |
| 60 | වීරවිල අංක - 02 | 4157 | 1100 | |
| 61 | වීරවිල අංක - 03 | 4221 | 1700 | |
| 62 | කහඳාව අංක - 01 | 3517 | 1900 | වී අලෙවි මණ්ඩලය |
| 63 | කහඳාව අංක - 02 | 4090 | 1900 | |
| | **එකතුව** | **35486** | **12800** | |

| අනු අංකය | ගබඩාවේ නම | වර්ග අඩි ප්‍රමාණය | ධාරිතාව මෙ.ටො. | කුලියට දී ඇති ආයතනය |
|---|---|---|---|---|
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | | | | |
| 64 | ශ්‍රාවස්තිපුර අංක - 01 | 25520 | 3575 | වී අලෙවි මණ්ඩලය |
| 65 | ශ්‍රාවස්තිපුර අංක - 02 | 23930 | 3350 | |
| 66 | කැකිරාව අංක - 01 | 7950 | 1275 | |
| 67 | කැකිරාව අංක - 02 | 7150 | 1145 | |
| 68 | සේනානායක අංක - 01 | 2461 | 390 | සී/ස ජනතා ඒකාබද්ධ ගොවි සමා. |
| 69 | සේනානායක අංක - 02 | 2461 | 396 | දේශීය වෛද්‍ය අමාත්‍යංශය |
| 70 | සේනානායක අංක - 03 | 11017 | 2400 | වී අලෙවි මණ්ඩලය |
| 71 | සේනානායක අංක - 04 | 2185 | 325 | සී/ස ජනතා ඒකාබද්ධ ගොවි සමා. |
| | **එකතුව** | **82674** | **12856** | |
| **පොළොන්නරුව දිස්ත්‍රික්කය** | | | | |
| 72 | කඳුරුවෙල අංක - 01 | 13419 | 2880 | වී අලෙවි මණ්ඩලය |
| 73 | කඳුරුවෙල අංක - 02 | 20187 | 3200 | |
| 74 | හිඟුරක්ගොඩ අංක - 01 | 23550 | 4400 | ස.තො.ස |
| 75 | හිඟුරක්ගොඩ අංක - 02 | 23550 | 4400 | |
| | **එකතුව** | **80706** | **14880** | |
| **නුවරඑළිය දිස්ත්‍රික්කය** | | | | |
| 76 | බ්ලැක්පූල් අංක - 01 | 1514 | 280 | නුවරඑළිය කෘෂිකාර්මික සමුපකාර සමිතිය |
| 77 | බ්ලැක්පූල් අංක - 02 | 1836 | 150 | |
| 78 | බ්ලැක්පූල් - 02 ඉහළ මහළ | 1824 | - | |
| 79 | බ්ලැක්පූල් අංක - 03 | 2335 | 435 | |
| | **එකතුව** | **7509** | **865** | |
| **රත්නපුර දිස්ත්‍රික්කය** | | | | |
| 80 | රත්නපුර ගබඩාව | 9611 | 1800 | සී/ස බඹරබොටුව මාරපන වි.සේ.ස සහ ලංකා සතොස ආයතනය |
| 81 | ඕපනායක අංක - 01 | 7730 | 1335 | ලාල් ස්ටෝර්ස් |
| 82 | ඕපනායක අංක - 02 | 5300 | 850 | විදුලිබල මණ්ඩලය |
| 83 | ඇහැළියගොඩ අංක - 01 | 2337 | 435 | සී/ස ඇහැළියගොඩ වි.සේ.ස |
| 84 | ඇහැළියගොඩ අංක - 02 | 2373 | 435 | |
| 85 | ඇහැළියගොඩ අංක - 03 | 4806 | 900 | |
| 86 | කහවත්ත අංක - 01 | 3180 | 590 | සී/ස පන්නිල්පත්තු වි.සේ.ස |
| 87 | කහවත්ත අංක - 02 | 1881 | 150 | |
| | **එකතුව** | **37218** | **6495** | |

| අනු අංකය | ගබඩාවේ නම | වර්ග අඩි ප්‍රමාණය | ධාරිතාව මෙ.ටො. | කුලියට දී ඇති ආයතනය |
|---|---|---|---|---|
| | මොණරාගල දිස්ත්‍රික්කය | | | |
| 88 | මොණරාගල අංක 01 | 22480 | 3150 | වී අලෙවි මණ්ඩලය |
| 89 | මොණරාගල අංක - 02 | 7000 | 1250 | ස.තො.ස |
| | **එකතුව** | **29480** | **4400** | |
| | මාතලේ දිස්ත්‍රික්කය | | | |
| 90 | මාතලේ අංක - 01 | 21448 | 3000 | මොහොමඩ් අෂ්රොෆ් මයා |
| | **එකතුව** | **21448** | **3000** | |
| | බදුල්ල දිස්ත්‍රික්කය | | | |
| 91 | බදුල්ල අංක-01 | 7245 | 1380 | ආහාර දෙපාර්තමේන්තුව |
| 92 | බදුල්ල අංක -02 | 6781 | 1500 | විදුලිබල මණ්ඩලය |
| 93 | හපුතලේ අංක - 01 | 1653 | 130 | හපුතලේ වි.සේ.ස |
| 94 | හපුතලේ අංක - 02 | 1806 | 120 | හපුතලේ වි.සේ.ස |
| | **එකතුව** | **17485** | **3130** | |
| | අම්පාර දිස්ත්‍රික්කය | | | |
| 95 | අම්පාර අංක - 01 | 11368 | 2125 | ආහාර දෙපාර්තමේන්තුව |
| 96 | අම්පාර අංක - 02 | 11368 | 2125 | වී අලෙවි මණ්ඩලය |
| | **එකතුව** | **22736** | **4250** | |
| | මඩකලපුව දිස්ත්‍රික්කය | | | |
| 97 | මඩකලපුව අංක - 01 | 18000 | 6000 | බ්‍රැන්ඩික්ස් ආයතනය |
| 98 | මඩකලපුව අංක - 02 | 17600 | 6000 | දි.ලේ |
| 99 | මඩකලපුව අංක - 03 | 17600 | 6000 | බ්‍රැන්ඩික්ස් ආයතනය |
| 100 | මඩකලපුව අංක - 04 (දුම්රිය පොළ අසළ ගබඩාව) | 13560 | 2800 | සතොස/දි.ලේ(මඩකලපුව) |
| | **එකතුව** | **66760** | **20800** | |


| අනු අංකය | ගබඩාවේ නම | වර්ග අඩි ප්‍රමාණය | ධාරිතාව මෙ.ටො. | කුලියට දී ඇති ආයතනය |
|---|---|---|---|---|
| **පුත්තලම දිස්ත්‍රික්කය** | | | | |
| 101 | පුත්තලම අංක - 01 | 5600 | 600 | දි.ලේ (පුත්තලම) |
| 102 | පුත්තලම අංක - 02 | 9600 | 1000 | |
| | **එකතුව** | **15200** | **1600** | |
| **වව්නියාව දිස්ත්‍රික්කය** | | | | |
| 103 | වව්නියාව අංක - 01 | 3763 | 775 | ස.තො.ස ආයතනය |
| 104 | වව්නියාව අංක - 02 | 4165 | 165 | දි.ලේ (වව්නියාව) |
| 105 | වව්නියාව අංක - 03 | 684 | 160 | |
| | **එකතුව** | **8612** | **1100** | |
| **ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය** | | | | |
| 106-110 | ලව්ලේන් සැ.ම (ගබඩා 05 යි.) | 28518 | 15000 | ගබඩා 03 ක් - නිවාස සංවර්ධන අධිකාරිය, ගබඩා 02 ක් - ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලය |
| | **එකතුව** | **28518** | **15000** | |
| **යාපනය දිස්ත්‍රික්කය** | | | | |
| 111-113 | නාවක්කුලි (ගබඩා 03) | 43200 | 7500 | දිස්ත්‍රික් ලේකම් (යාපනය) |
| | **එකතුව** | **43200** | **7500** | |
| **මන්නාරම දිස්ත්‍රික්කය** | | | | |
| 114 | මුරුන්කන් | 9720 | 1500 | ලෝක ආහාර වැඩසටහනට ලබා දී ඇත |
| | **එකතුව** | **9720** | **1500** | |

# ශ්‍රී ලංකාව තුළ ආහාර දෙපාර්තමේන්තුව සතු ගබඩාවල ව්‍යාප්තිය




## ❖ ගබඩා ආදායම

| වර්ෂය | ලැබිය යුතු ආදායම | ලැබූ ආදායම |
|---|---|---|
| **2013** | 68,307,972.00 | 56,026,609.36 |
| **2014** | 80,000,000.00 | 73,072,795.86 |




## ❖ නිවාස ආදායම

| වර්ෂය | ලැබිය යුතු ආදායම | ලැබූ ආදායම |
|---|---|---|
| **2013** | 5,181,325.00 | 4,372,845.00 |
| **2014** | 5,245,380.00 | 4,978,211.20 |



# (09). ගිණුම් ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචනය

ආහාර සුරක්ෂිත තාවය පදනම් කරගත් රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම ප්‍රමුඛ කාර්යයක් සේ සළකා කටයුතු කරමින්, දෙපාර්තමේන්තුවේ සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරි සැලැස්ම සකසා තිබුනි. එම ගමන් මග සාක්ෂාත් වන අන්දමින් ඊට අදාළ 2014 වාර්ෂික ඇස්තමේන්තුව සකසන ලදී.

දෙපාර්තමේන්තුව විසින් සකසන ලද ඇස්තමේන්තුව මගින් දක්වන ලද ඇතැම් වැය විෂයයන් යටතේ ඉල්ලා සිටින ලද ප්‍රතිපාදන වාර්ෂික ඇස්තමේන්තුව මගින් සළසා දී නොතිබුණි.

තවද ප්‍රතිපාදන ලබා දි තිබූ වැය විෂයන් සඳහා පාලනය කළ හැකි වියදම් පාලනය කිරීමේ සැලසුම් ක්‍රියාත්මක කරන ලදී. වර්ෂය ආරම්භයේදී සකසන ලද ප්‍රසම්පාදන සැළැස්ම හා ඊට අතිරේකව දෙපාර්තමේන්තු අවශ්‍යතාවයන් මු.රෙ.66 මාරු කිරීම් අනුව ඉටු කර ගත හැකි විය

## පුනරාවර්තන වියදම්

දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන අවම හා පාලනීය වියදම් ප්‍රතිපත්තිය 2014 වර්ෂයේදී ද ක්‍රියාත්මක කිරීම හේතුවෙන් වාර්ෂික ඇස්තමේන්තු මගින් පුනරාවර්තන වියදම් යටතේ සළසා දෙන ලද ප්‍රතිපාදන ඉක්මවා නොයන පරිදි කටයුතු කිරීම පහසුවක් වූ අතර වියදම් පාලනය හේතුවෙන් ඇතැම් වැය විෂයයන්ගේ ඇතිවූ ප්‍රතිපාදන අතිරික්තය මු.රෙ.66 ප්‍රකාරව නිසි අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව අත්‍යවශ්‍ය වැය විෂයයන් කිහිපයක් වෙත මාරු කර ගන්නා ලදී.

ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා නොයැමට වග බලා ගැනීමත්, අවශ්‍ය ප්‍රමාණයට ප්‍රතිපාදන ප්‍රතිශෝධනය කර ගැනීමට හැකිවීමත් මත ගිණුම්කරණ නීතිරීති හා උපදෙස් වලට අනුකූල නොවීමේ අවදානමෙන් මැත් වීමට දෙපාර්තමේන්තුවට හැකිවී ඇත.

## මූලධන වියදම්

මූලධන වැය විෂයය මත වාර්ෂික ඇස්තමේන්තු මගින් සළසා දී තිබූ ප්‍රතිපාදන උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගෙන ඇත.

සහල් මිලදි ගැනීම සඳහා ලබා දි තිබූ ප්‍රතිපාදනයන් අපේක්ෂා කළ ආකාරයට භාවිතා කළ නොහැකි වූයේ දෙපාර්තමේන්තුව අපේක්ෂා කළ ආකාරයට ගබඩා වෙත සහල් නොලැබීම මතය.

## ඇවර කිරීමේ ගිණුම්

දෙපාර්තමේන්තුව සතු ඇවර කිරීමේ ගිණුම් දෙක අතුරින් මුළුතැන්ගේ හා බේකරි අත්තිකාරම් ගිණුමේ පවතින්නාවූ එකම වගකීම වූ කාරක අලාභ ලියා හැරීම සඳහා අනුමැතිය ලබාගෙන ඇති අතර 2015 වර්ෂයේදී ඒ සඳහා අනුමැතිය ලබා දී ඇත.

අනෙක් ඇවර කිරීමේ අත්තිකාරම් ගිණුම වූ ආහාර බෙදාහැරීමේ අත්තිකාරම් ගිණුම සඳහා වන ඇවර කිරීමේ ගිණුමෙහි දැක්වෙන්නා වූ වත්කම් දැනට ආහාර දෙපාර්තමේන්තුවෙහි මෙහෙයුම් කටයුතු සඳහා යෙදවී ඇති බැවින් ඒවා උපලබ්ධි කිරීමේ ගැටළු ඇතිවී තිබේ. එබැවින් අදාළ ගිණුම අවසන් කිරීමේ කටයුතු කඩිනම් කිරීමේ හැකියාව අවම වී ඇත. ණයගැති ශේෂ ලියා හැරීමට අනුමැතිය ලබා ගැනීම ද කාරක පාඩු අදියර ගතව ලැබෙන ප්‍රතිපාදන මත ලියා හැරීම් ඉදිරියේදී සිදුකිරීමට ද නියමිතව ඇත.

## සමාප්තිය

රාජ්‍ය ප්‍රතිපත්තිය මත පවත්නා කාලීන අවශ්‍යතාවයන් මූලික කොටගෙන දෙපාර්තමේන්තුව වර්ෂය තුළ ගෙන ඇති ක්‍රියාමාර්ග ඉතා වැදගත් තත්වයක පවතී. එම කටයුත්ත ඉටුකිරීමෙහිලා උද්ගත වූ ප්‍රායෝගික තත්වයන් යටතේ උපරිම කැපවීමකින් හා විනිවිද භාවයෙන් යුතුව හා සියළු නීතිරීතිවලට අනුකූලව කටයුතු කරමින් ගැටළුවකින් තොරව වර්ෂයට අදාල ගිණුම් කටයුතු අවසන් කිරීමට හැකිවිය.

අයි.පී.කොතලාවල

ගණකාධිකාරී,

ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

# (10). වත්කම් හා දේපල

දෙපාර්තමේන්තුව තුළ පවත්නා වත්කම්, ආහාර බෙදා හැරීමේ අත්තිකාරම් ගිණුම යටතේ අත්පත් කරගෙන ඇති වත්කම් වශයෙන් පවතිනු ලැබ ඇත. එම වත්කම් සියල්ල දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කටයුතු සඳහා 2014.12.31 දින වන විටත් උපයෝගී කර ගනිමින් පැවතින.

ඒ අනුව 2014.12.31 දිනට වත්කම් විශ්ලේෂණය පහත පරිදි වේ.

| # | වත්කම් | පිරිවැය වටිනාකම 2014.12.31 දිනට |
|---|---|---|
| **I.** **ආහාර බෙදා හැරීමේ අත්තිකාරම් ගිණුම යටතේ පවත්නා වත්කම්** | | |
| | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 121,065,254.11 |
| | වාහන | 15,016,458.27 |
| | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 9,215,359.14 |
| | ලී බඩු සහ කාර්යාලයීය උපකරණ | 22,962,954.35 |
| | **මුළු එකතුව** | **168,260,025.87** |

# (II). ආදායම් සහ අය කිරීම්

■ **ආදායම් :**

| # | 2014.01.01 දිනට අයවිය යුතුව පැවති ණය ශේෂය | රුපියල් |
|---|---|---|
| I. | ගබඩා කුලිය | 69,765,510.86 |
| II. | නිවාස කුලිය | 3,047,337.50 |
| | **එකතුව** | **72,812,848.36** |

| # | වර්ෂය තුළ අය කරගත් ආදායම | රුපියල් |
|---|---|---|
| I. | ගබඩා කුලිය | 73,072,795.86 |
| II. | නිවාස කුලිය | 4,978,211.20 |
| | **එකතුව** | **78,051,007.06** |

| # | 2014.12.31 දිනට අයවිය යුතුව පැවති හිඟ ණය ශේෂය | රුපියල් |
|---|---|---|
| I. | ගබඩා කුලිය | 77,054,071.25 |
| II. | නිවාස කුලිය | 3,013,378.00 |
| | **එකතුව** | **80,067,449.25** |

■ **අයකිරීම් :**

❖ **සමූපකාර ණය ශේෂයන් :**

| | | |
|---|---|---|
| **2014.01.01 දිනට සමූපකාර වෙතින් අයවිය යුතුව පැවති ණය ශේෂය** | රු: | 200,061,967.97 |
| **වර්ෂය තුළ අය කරගත් වටිනාකම** | රු: | 295,554.26 |
| **2014.12.31 දිනට අයවිය යුතුව පැවති හිඟ ණය ශේෂය** | රු: | 199,766,413.71 |

❖ **තොග හිඟ අය කිරීම් (අධිභාර ණය ශේෂයන්) :**

| | | |
|---|---|---|
| **2014.01.01 දිනට අධිභාර අයවිය යුතු ණය ශේෂය** | රු: | **49,553,791.68** |
| **2014 වර්ෂය තුළ පනවන ලද අධිභාර වටිනාකම** | රු: | |
| **වර්ෂය තුළ අයකරගත් අධිභාර වටිනාකම** | රු: | 76,693.05 |
| **2014.12.31 දිනට අයවිය යුතුව පැවති ණය ශේෂය** | රු: | 49,477,098.63 |

# (12). මූල්‍ය වාර්තා

ශීර්ෂ අංකය : 300
අමාත්‍යංශය /දෙපාර්තමේන්තුව : ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව
වැඩ සටහන් අංකය : 01
ව්‍යාපෘතිය : 01

**පුනරාවර්තන වියදම්**

| විස්තරය | 2013 සත්‍ය වියදම රුː ශතː | 2014 අනුමත ඇස්තමේන්තුව රුː ශතː | 2014 සංශෝධිත ඇස්තමේන්තුව රුː ශතː | 2014 සත්‍ය වියදම රුː ශතː | 2014 ඉතිරිය රුː ශතː |
|---|---|---|---|---|---|
| පුද්ගල වේතන | 42,038,548.00 | 46,275,000.00 | 42,575,000.00 | 42,482,259.00 | 92,741.00 |
| වෙනත් | 146,030,728.00 | 30,482,000.00 | 109,265,000.00 | 108,276,346.00 | 988,654.00 |
| **එකතුව** | **188,069,276.00** | **76,757,000.00** | **151,840,000.00** | **150,758,605.00** | **1,081,395.00** |

Developing an Improved Buffer-Stocks System

## මූලධන වියදම්

| වැය විෂය | විස්තරය | 2013 සත්‍ය වියදම රු: | 2014 අනුමත ඇස්තමේන්තුව රු: | 2014 සංශෝධිත ඇස්තමේන්තුව රු: | 2014 සත්‍ය වියදම රු: | 2014 ඉතිරිය රු: |
|---|---|---|---|---|---|---|
| **මූලධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීම්** | | | | | | |
| 2001 | ගොඩනැගිලි හා ඉදි කිරීම් | 16,414,187.00 | 10,000,000.00 | 14,310,000.00 | 14,290,936.00 | 19,064.00 |
| 2002 | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 532,680.00 | 300,000.00 | 462,000.00 | 461,493.00 | 507.00 |
| 2003 | වාහන | 901,835.00 | 800,000.00 | 1,060,000.00 | 1,049,240.00 | 10,760.00 |
| | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | | | | | |
| 2101 | වාහන | | | | | |
| 2102 | ලී බඩු හා කාර්යාලයීය උපකරණ | 653,057.00 | 400,000.00 | 885,000.00 | 883,973.00 | 1,027.00 |
| 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 235,000.00 | 200,000.00 | 200,000.00 | 16,160.00 | 183,840.00 |
| 2401 | පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 124,500.00 | 258,000.00 | 268,000.00 | 262,700.00 | 5,300.00 |
| 2502 | ආහාර දෙපාර්තමේන්තු ගබඩා අළුත්වැඩියාව | | 10,000,000.00 | 5,690,000.00 | - | 5,690,000.00 |
| | **එකතුව** | **18,861,259.00** | **21,958,000.00** | **22,875,000.00** | **16,964,502.00** | **5,910,498.00** |

| මූල්‍ය ප්‍රභවයන් | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| වැඩ සටහන | විස්තරය | 2013 සත්‍ය වියදම රු: | 2014 අනුමත ඇස්තමේන්තුව රු: | 2014 සංශෝධිත ඇස්තමේන්තුව රු: | 2014 වියදම රු: | 2014 ඉතිරිය රු: |
| 01. | ඒකාබද්ධ අරමුදල | 253,279,000 | 98,715,000 | 174,715,000 | 167,723,107 | 6,991,893 |
| 07. | විසර්ජන නීතිය | | | | | |
| | විශේෂ නීති සේවා | | | | | |
| | විදේශාධාර | | | | | |
| | ණය | | | | | |
| | ආධාර | | | | | |
| | ප්‍රතිපූර්ණ කළ හැකි විදේශාධාර | | | | | |
| | ණය | | | | | |
| | ආධාර | | | | | |
| | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | |
| | විදේශාධාර | | | | | |
| **01+07** | **මුළු වියදම** | 253,279,000 | 98,715,000 | 174,715,000 | 167,723,107 | 6,991,893 |

# (13). ක්‍රියාකාරිත්වය හා ප්‍රගතිය

- **ආදායම් ප්‍රවර්ධනය**

1. දෙපාර්තමේන්තුව සතු ගබඩා අතරින් මෙහෙයුම් කටයුතු සඳහා භාවිත නොකරන ලද ගබඩා බාහිර ආයතන වෙත කුලියට /බද්දට ලබාදීම හා ධාන්‍යාගම පිහිටි ප්‍රීමා නිවාස කුලියට දීම ප්‍රධාන ආදායම් ප්‍රභවය වූ අතර ආදායම් ප්‍රවර්ධනය සඳහා අදාල ගාස්තු සංශෝධනය කිරීමටත්, ගිවිසුම් ගත අඩුපාඩු මගහරවා ගැනීමටත් ඒ අනුව නව ගිවිසුම් වලට එළඹීමටත් කටයුතු කර ඇත.

2. ඒ අනුව රු. 73,072,795.86 ක ගබඩා ආදායමක් සහ රු. 4,978,211.20 ක නිවාස ආදායමක් රජයේ ආදායමට බැර කිරීමට හැකියාව ලැබී ඇති අතර, එමගින් රජයේ ආදායම වර්ධනය කර ගැනීම සඳහා දායකත්වය ලබාදී ඇත.

3. දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වෙමින් පැවති වාණිජ අත්තිකාරම් ගිණුම් දෙකකි. ඉන් එකක් වූ දැනට ඇවර කරමින් පවතින ආහාර බෙදාහැරීමේ අත්තිකාරම් ගිණුමෙහි පැවැති ආහාර මුද්දර යටතේ බෙදා හැරීම සඳහා සමූපකාර සමිති වෙත ලබාදුන් භාණ්ඩ වෙනුවෙන් අයවීමට පැවැති මුදලින් රු. 295,554.26 ක වටිනාකමක් අයකර ගැනීමට කටයුතු කිරීම.

4. එම ගිණුම යටතේ අයවිය යුතුව පැවති තොග හිග අධිභාර ශේෂයෙන් රු. 76,693.05 මුදලක් අයකර ගැනීමට ද හැකි වී ඇත.

5. දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මකවූ අනෙක් වාණිජ අත්තිකාරම් ගිණුම වූ ඇවර කරමින් පැවති මුළුතැන්ගේ හා බේකරි අත්තිකාරම් ගිණුමේ පවත්නා කාරක අලාභ ශේෂය හැරෙන්නට අනකුත් වත්කම් හා වගකීම් පියවා දමා ඇති අතර, අදාළ ශේෂය ලියා හැරීම සඳහා ඇවැසි ප්‍රතිපාදන සලසා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට 2014 වර්ෂයේදී කටයුතු කර ඇත.

- **ජාතික වැඩ සටහන් සඳහා දායකත්වය.**

1. 2014 වර්ෂයට කුරුණෑගල දිස්ත්‍රික්කයේ දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශනය සඳහා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් ප්‍රදර්ශන කුටියක් පැවැත්වීම.